1194

(7)

මගේ අංකය :- 2/7/2/10
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
කුරුණෑගල,
2018/10/18.

01.ගොවි සංවිධාන නිලධාරීන්,
නියෝජිත මහත්ම මහත්මීන්,
02. රාජ්‍ය අංශයේ හා ආයතන මට්ටමේ
ආයතන ප්‍රධානීන් /නිළධාරී මහත්ම මහත්මීන්

**2018/2019 මහ කන්න රැස්වීමේ වාර්තාව**
**වගා කාල සටහන හා පොදු තීන්දු ප්‍රකාශය- හක්වටුනාඔය ව්‍යාපාරය. 2018/10/18**

1946 අංක 32 දරණ වාරිමාර්ග අඥාපනතේ සඳහන් පරිදි 1968 අංක 13 දරණ (සංශෝධිත) වාරිමාර්ග අඥාපනතේ 458 අධිකාරියෙහි 19 වැනි රෙගුලාසිය අනුව හක්වටුනාඔය මහාවාරිමාර්ග ව්‍යාපාරයේ 2018/2019 මහ කන්නයට අදාළ වගා කාල සටහන සැකසීම සහ පොදු තීන්දු ප්‍රකාශයක් සාකච්ඡා කොට අනුමත කර ගැනීම සඳහා වූ කන්න රැස්වීම කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් ගාමිණී ඉලංගරත්න මහා මාගේ ප්‍රධානත්වයෙන් හක්වටුනාඔය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයීය රැස්වීම් ශාලාවේදී 2018/10/18 දින ප.ව 2.00 පමණ පවත්වන ලදි.

02.සහභාගීත්වය
මෙම රැස්වීමට රාජ්‍ය නිළධාරීන් 44 දෙනෙක් හා ගොවි සංවිධාන නිළධාරීන් හා ගොවි නියෝජිත මහත්ම මහත්මීන් 26 දෙනෙකු ද සහභාගී විය.

03.ප්‍රථමයෙන්ආගම සිහිකිරීමෙන් අනතුරුව නේවාසික ව්‍යාපාර කළමනාකාර මහතා විසින් රැස්වීමට සහභාගී වූ කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් තුමා ඇතුලු රාජ්‍ය නිළධාරීන් සහ ගොවි සංවිධාන නිළධාරීන්, ගොවි නියෝජිත මහත්ම මහත්මීන් පිළිගැනීමෙන් අනතුරුව දිස්ත්‍රික් ලේකම්තුමා වෙත මුලාසනය භාරදෙන ලදී.

04. දිස්ත්‍රික් ලේකම්තුමා මුලාසනය භාරගනිමින් අද දින මෙම රැස්වීමට සහභාගීවූ සියළුම රාජ්‍ය නිළධාරීන් හා ගොවි නියෝජිත මහත්ම මහත්මීන් පිළිගන්නා බවත්, අරමුණ වශයෙන් 2018/2019 මහ කන්නය සඳහා වගා කාල සටහන හා පොදු තීන්දු ප්‍රකාශය සකස් කොට අනුමත කර ගැනීම බවත්, ඒ සඳහා අදාල ආයතන වලට න්‍යාය පත්‍රානුකූලව අදහස් සහ යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

05.වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම.
වාරිමාර්ග ඉංජිනේරු
හක්වටුනාඔය ජලාශයේ ජල ධාරිතාව මේ වනවිට (2018/10/18 ) අක්කර අඩි 15.6 ක් බවත්, ඒ අනුව ධාරිතාවය අක්කර අඩි 9858 බවත් ,එමඟින් දෙපාර්තමේන්තු නිර්දේශය අනුව, ජලාශයට ආසන්නයේ අක්කර 2000 ක් වගා කිරීමට හැකියාව ඇති බවත් , දැනට මෝසම් වැසි සක්‍රීය තත්වයට පත්වී ඇති නිසා ඉදිරියේදී කන්නයට නියමිත පරිදි වැසි ලැබීමේ ක්‍රමානුකූල බවක් දක්නට ඇති බව ප්‍රකාශ කරන ලදී.

තවද CRIP ව්‍යාපෘතියේ ඉදිකිරීම් හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් ගැටළුවකට නොගෙන වගාකටයුතු කර ගන්නා ලෙසත් යම් හෝ ගැටළු තත්වයක් ඇති වී තිබේ නම් ඒ සඳහා මැදිහත්වී විසඳුම් ලබාදීමට දෙපාර්තමේන්තුව වශයෙන් වග කියන බවත් දැනුම්දෙන ලදී.

දිස්ත්‍රික් ලේකම්තුමා-කුරුණෑගල

දැනට ඇති වපසරිය අක්කර 6371 වන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශය අනුව,වගාකල හැක්කේ අක්කර 2000 ක් වුවද අහස් දිය ප්‍රයෝජනයට ගෙන මූලික බිම් සකස් කිරීමේ කටයුතු කර ගන්නා ලෙසත්, ජලාශයේ ජලය ඒ මගින් රැකගැනීමට හැකියාව ඇති බවත්, තමන් සහභාගී වූ කන්න රැස්වීම් කීහිපයකම අහස් දියෙන් ලැබෙන ජලයෙන් මූලික බිම් සකස් කිරීම සඳහා තීරණ ගත් බවත්, ජලාශයේ ජල මට්ටම සැලකීමට ගැනීමේදී 60% ක ප්‍රමාණයක් පමණක් පිරී ඇති බවත්, වර්ෂා ජලයෙන් උපරිම ප්‍රයෝජන ගතහොත් ඉදිරියේදී ඇතිවන අවධානම අවම කර ගැනීමට හැකියාව ඇතිබව පැහැදිලි කර දෙන ලදී.

අනතුරුව දිස්ත්‍රික් ලේකම්තුමා කන්නය පිළිබඳ අදහස් දැක්වීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අවස්ථාව ලබා දෙනලදී.

06.කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ඉදිරිපත් කිරීම කෘෂිකර්ම උපදේශක- රඹේ කලාපය

පසුගිය කන්නය පිළිබඳව අත්දැකීම් සම්බන්ධව අදහස් දැක්වීමේදී, 2018 යල කන්නය අක්කර 2683 ක් වගාකල බවත්, එය වැවේ තිබූ ජල ධාරිතාව අනුව ගැටළුවක් නොවුවද, ජූනි 5-10 කාලය වගාවේ නිරත වූ බැවින් දුඹුරු පැළ කීඩැවගේ හානිය වසංගත තත්වයක් ලෙස පැමිණීමත් සමඟම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට එය මර්ධනය කිරීම සඳහා දැඩි කැපකිරීමක් සහ උත්සහක් ගැනීමට සිදු වූ බවත්,මෙම කන්නයේදී ද එම අත්දැකීම් ප්‍රයෝජනයට ගත යුතු අතරම,
කාලගුණ දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට නිකුත් කරන ලද වාර්තාව අනුව මෙම කන්නයේ වැහිරටාව සාමාන්‍ය පරිදි ලැබෙන බවත්, කන්නය අග කාලයේදී එනම් දෙසැම්බර්-සිට ජනවාරි වනවිට මෙම ලැබෙන වැහි රටාවේ යම් අඩුවීමක් පෙන්නුම් කරන බවත්, ඒ අනුව පෙර කන්න රැස්වීමේ වගා කාල සටහන අනුව වගල් ආශ්‍රිතව මාස 4 වී වගා කිරීමට යොමුවන අය ඔක්තෝබර් මස 15-20 ට පෙර වගාකරන ලෙසත් මාස 3 - 3 ½ නොවැම්බර් පළමු සතියටද, මාස 3 වී නොවැම්බර් 15 දක්වා කාලයටද වගාකිරීමට යොමුවීමේදී පෙබරවාරි 15 කාල සීමාව තුළ වගාව අවසන් කිරීමට හැකියාව ඇති බවත්, පෙන්වා දෙන ලදී. බීජ වී සම්බන්ධව අදහස් දක්වමින් කියාසිටියේ තාමත් බිත්තර වී ගොවීන් තුළ අස්වනු නෙළමින් පවතින අතර සැප්තැම්බර් 20-25 කාලයේ අස්වනු නෙලා තිබෙන බීජ වී සුත්ත කාලය ගත වී නැති අතර, ඒවා සාම්පල් පරීක්ෂාවට ලක්කිරීමට කාලයක් ගත වන බවත් කීඩැ හානිය නිසා අක්කර 7-8 ප්‍රමාණයක බිත්තර වී ඉවත් වූ බවත්, දැනට පවතින වී ප්‍රයෝජනයට ගෙන ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් හෝ පුද්ගලික ආයතනයකින් ලබාගෙන වගාකටයුතු කරන ලෙසත්, දැනුම් දෙන ලදී. තවද පාරම්පරික වී ප්‍රචලිත කිරීමේ වැඩ සටහනක් ආරම්භ කර තිබෙන අතර, ඒ සඳහා අවශ්‍ය වී වර්ග සුළු ප්‍රමාණ වශයෙන් ලබා දීමේ හැකියාව තිබෙන බවත් ප්‍රකාශ කල අතරම, ඉහත දක්වන ලද කරුණු සලකා බලා පෙර කන්න රැස්වීමේ තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

අනතුරුව දිස්ත්‍රික් ලේකම්තුමා කන්නය පිළිබඳ අදහස් දැක්වීමට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අවස්ථාව ලබා දෙන ලදී.

07.ගොවිජන සේවා දෙපාර්තමේන්තුව -ප්‍රාදේශීය සංවර්ධන නිළධාරි

අද දිනයේදී, නියෝජ්‍ය කොමසාරිස්තුමාට සහභාගී වීමට නොහැකි වුයේ ප්‍රාදේශීය නිළධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්වීම නිසා බවද, 2018 -2019 මහ කන්නයේ පොහොර වැඩ සටහන මේ වන විටත් ආරම්භ කර ඇති බවත්, ගොවිජනසේවා මූලස්ථානයට පොහොර සපයා ගෙන ඇති අතර

හක්වටුනාඔය ව්‍යාපාරයට අදාල පොහොර තොග ගොවීන්ට ලබාගැනීමේ හැකියාව ඇති බවද, දැනට කෘෂිකර්ම පර්යේෂණ නිළධාරීන් හරහා අදාළ ලේඛන පරිගණක ගත කිරීම සිදුකර ඇති බවද , ඒ සඳහා පොහොර මුදල් ගෙවා අදාල ලේඛන ඉදිරිපත් කිරීමෙන් පසු අවශ්‍ය පොහොර ප්‍රමාණය ලබාගත හැකිබව දන්වා සිටින ලදී. තවද ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් බිත්තර වී අවශ්‍යතාවය අනුව ලබාගත හැකි බවද ගොවිබැංකුව මඟින් වගා ණය නිකුත් කිරීමේ කටයුතු මේ දිනවල සිදුකරන අතර, වසම් තුළ ක්‍රියාත්මක කුඩා කණ්ඩායම් හරහා කටයුතු කිරීමට හැකි බවත්, අදාළ වසම භාර කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිළධාරීන් ගෙන් ලබාගත හැකි බව දැනුම් දෙන ලදී.

පොහොර සහනාධාරය ලබාදීමේ වැඩසටහන පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට ජාතික පොහොර ලේකම් කාර්යාලයට දිස්ත්‍රික් ලේකම්තුමා විසින් අවස්ථාව ලබාදෙන ලදී.

<u>08. ජාතික පොහොර ලේකම් කාර්යාලයේ- සහකාර අධ්‍යක්ෂ</u>

මෙවර පොහොර සහනාධාරය හෙක්ටයාර 02 කට හිමිවන බවත්, දැනට කෘෂිකර්ම පර්යේෂණ නිළධාරී තොරතුරු රැස්කිරීමේ කටයුතු වල නිරත වන බවත්, වගාකරන ලබන බිම් ප්‍රමාණයම නිවැරදිව සටහන් කිරීමට ගොවීන් වගාබලා ගත යුතු අතර පසුගිය කන්නයේ එසේ නොකිරීම නිසා පැමිණිලි ලැබී තිබෙන බවද, දැනුම්දෙන ලදී. මෙවර පොහොර මිටියක් රු 500.00 ක මුදලට හිමිවන බවද,මහාවාරි ව්‍යාපාරයේ හෙක්ටයාරයක් සඳහා යූරියා කි.ග්‍රෑ 215ක්ද ,T.S.P කි. ග්‍රෑ 50 ක්ද ,M.O.P කි. ග්‍රෑ 55 ක්ද සුළු වාරි සඳහා යූරියා කි. ග්‍රෑ 190ක්ද ,T.S.P කි. ග්‍රෑ 50 ක්ද ,M.O.P කි. ග්‍රෑ 55 අහස් දිය සඳහා යූරියා කි. ග්‍රෑ 165ක්ද ,T.S.P කි. ග්‍රෑ 35ක්ද ,M.O.P කි. ග්‍රෑ 45ක් ලැබෙන බවත්, කුඹුරුවල වගා කරන අතිරේක බෝග සඳහා ද වර්ෂා පෝෂිත පොහොර සහනාධාර ප්‍රමාණය ලබා ගත හැකි අතර මේ වන විට ගොවිජන සේවා මධ්‍යස්ථානය පොහොර තොග රැස් කරමින් පවතින බව ප්‍රකාශ කරන ලදී.

කෘෂි රක්ෂණ වැඩසටහන පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට කෘෂි රක්ෂණ මණ්ඩලයට දිස්ත්‍රික් ලේකම්තුමා විසින් අවස්ථාව ලබාදෙන ලදී

<u>09.කෘෂි රක්ෂණ මණ්ඩලය- සහකාර අධ්‍යක්ෂ</u>

අක්කරයට රුපියල් 40000.00 ක මුදලක් රජය මඟින් සියලුම ගොවි මහතුන්ට හිමි රක්ෂණාවරණයක් ලැබෙන බවත්, වී වගාව අක්කර 05ක් සඳහා ද, අමතර බෝග අක්කර 2 ½ ක් සඳහාද , මෙය ලබා දෙන අතරම එය ලබා ගත හැකි වන්නේ වල් අලින්ගෙන් හෝ නියඟයෙන් හෝ ගං වතුරින් වන හානි සඳහා පමණක් බවද අමතරව යම්කිසි රක්ෂණාවරණයක් ලබා ගන්නේ නම් ඒ සඳහා හැකියාව තිබෙන බවද, කීඩා හානිය සඳහා රක්ෂණාවරණයක් ලබා ගන්නේ නම් රුපියල් 200.00 ක මුදලකින් රක්ෂණාවරණය ලබා ගත හැකි බවත් පෙන්වා දෙන ලදී. තවද යම්කිසි වන්දි මුදලක් ලබා දෙන්නේනම් එය ගොවි නායකයින්ගේ නිර්දේශය මත පමණක්ම ගෙවීම් කරන බවද තවහුරු කිරීම හා ගොවීන්ට නිර්දේශය ලබා දීමේදී ලැබිය යුතු පුද්ගලයාටම නිර්දේශය ලබා දීමට ගොවි නායකයින් කටයුතු කරන ලෙසත් දැනුම් දෙන ලදී. මේ සම්බන්ධව රාජ්‍ය විගණන අංශය දැඩිව ක්‍රියාත්මක වන බවද තවදුරටත් පැහැදිලි කරන ලදී.

<u>10. පෙර කන්න රැස්වීමේ තීන්දු තීරණ දැනුම් දීම.</u>

<u>ඉදිරිපත් කිරීම- නේවාසික ව්‍යාපාර කළමනාකරු- හක්වටුනාඔය ව්‍යාපාරය.</u>

<u>පෙර කන්න රැස්වීමේ වගා තීරණ දැනුම්දීම - 2018/2019 මහ කන්නය - 2018/10/04.</u>

1994 අංක 13 දරණ වාරිමාර්ග පනතින් (සංශෝධිත) 1969 අංක 48 දරණ වාරිමාර්ග අඥාපනතේ විධිවිධාන අනුව 2018/10/04 දින හක්වටුනාඔය නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලයේදී පවත්වන ලද හක්වටුනාඔය මහාවාරි ව්‍යාපාරයේ 2018/2019 මහ කන්නය සඳහා යෝජිත වගා කාලසටහන.

| අනු අංකය | කාරණය | තීන්දුව |
|---|---|---|
| 1. | වගා කරනු ලබන බිම් ප්‍රමාණය | අක්කර 6371 |
| 2. | වගා කරනු ලබන බෝගය | මාස 3 සහ මාස 3 1/2 වී සහ වෙනත් බෝග |
| 3. | වගාව ආරම්භ කිරීම | |
| 4. | ඇළ වේළි ශුද්ධ කිරීම<br>ප්‍රධාන ඇළ (වාරිමාර්ග දෙපා: මඟින්)<br>බෙදුම් ඇළ (ගොවි සංවිධානය මඟින්)<br>කෙත් ඇළ (ගොවීන් විසින්) | 2018/10/20 ට පෙර<br>2018/10/15 ට පෙර<br>2018/10/15ට පෙර |
| 5. | ශුද්ධ නොකරන ලද ඇළවේළි ශුද්ධ කිරීම | 2018/10/20 ට පෙර<br>(ගොවි සංවිධාන අරමුදල් යොදා) |
| 6. | වගා කටයුතු ආරම්භ කිරීම | 2018/10/21සිට |
| 7. | වගාව පිහිටුවා අවසන් කිරීම | 2018/11/10 ට පෙර |
| 8. | මුර ජලය නිකුත් කිරීම | 2018/11/12 සිට |
| 9. | වගාව සඳහා ජලය නිකුත් කිරීම අවසන් කිරීම | 2019/02/15 |
| 10. | වගා රක්ෂණය අවසන් කළ යුතු දිනය | 2018/11/10 ට පෙර |
| 11. | වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය | හානී වී දින14 ක් ඇතුළත |
| 12. | අස්වනු නෙළා අවසන් කළයුතු දිනය | 2019/03/15 ට පෙර |

විශේෂ කරුණු:-

❖ 2018/10/20 දිනට ප්‍රධාන ජලාශයේ ජල මට්ටම අඩි 18ට හෝ ඊට වැඩි නම් ඉවුරු දෙකේම වී වගාව සිදුකිරීමට තීරණය කරන ලදී.

1994 අංක 13 දරණ (සංශෝධිත) වාරිමාර්ග අඥාපනතේ II වන උප වගන්තිය අනුව ඉදිරි කන්නයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත නීති රීති.

1. කෙත් ඇළ සහ බෙදුම් ඇළ නඩත්තුව සඳහා අක්කරයකට රු.300.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.
2. නියමිත දිනට බෙදුම් ඇළ සහ කෙත් ඇළෙහි තම කොටස නඩත්තු නොකරන ගොවීන්ගෙන් බඹයකට රු.200.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.
3. ගවයන් වගා බිම් වලට අනවසරයෙන් ඇතුළත් කිරීම හා වගා පාලු කිරීමේ දඩය ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ තක්සේරු අනුව.
4. වාරි නිර්මිත වලට හානි කිරීම හා අනවසරයෙන් බට දැමීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තක්සේරු අනුව

ඉහත 2018/2019 මහ කන්නය සඳහා පෙර කන්න රැස්වීමේ දී ගන්නා ලද තීන්දු තීරණ හා නීති රීති සුදුසු බවට වම් ඉවුර ඩී 6 වඩුරුස්ස බෙදුම් ඇළ ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලද අතර, දකුණු ඉවුර යාය 7 ඇනිකට්ඇළ ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා විසින් එය ස්ථිර කරන ලදී.

11.2018/2019 මහ කන්නයේ වගා තීන්දු තීරණය කිරීම සම්බන්ධයෙන් ගොවි සංවිධානවල අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම.

ගොවි සංවිධානවල අදහස් හා යෝජනා කිසිවක් ඉදිරිපත් නොවීය.

12.2018/2019 මහ කන්නය සඳහා වගා කාල සටහනක් හා පොදු තීන්දු තීරණ ප්‍රකාශයක් පිළියෙළ කිරීම.
ඉදිරිපත් කිරීම- නේවාසික ව්‍යාපාර කළමනාකරු -හක්වටුනාඔය

2018/2019 මහ කන්න රැස්වීමේ වගා තීරණ දැනුම්දීම -හක්වටුනාඔය මහාවාරි ව්‍යාපාරය.

1994 අංක 13 දරණ වාරිමාර්ග පනතින් (සංශෝධිත) 1969 අංක 48 දරණ වාරිමාර්ග අඥාපනතේ විධිවිධාන අනුව 2018/10/18 දින හක්වටුනාඔය නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලයේදී පවත්වන ලද හක්වටුනාඔය මහාවාරි ව්‍යාපාර බල ප්‍රදේශය සඳහා 2018/2019 මහ කන්න රැස්වීමේදී එළඹෙන ලද තීරණ,

| අනු අංකය | කාරණය | තීන්දුව |
|---|---|---|
| 1 | වගා කරනු ලබන බිම් ප්‍රමාණය | අක්කර 6371 |
| 2 | වගා කරනු ලබන බෝගය | මාස 3 සහ මාස 3 1/2 වී සහ අතිරේක |
| 3 | වගාව ආරම්භ කිරීම | වර්ෂා ජලයෙන්. (අවශ්‍යතාව අනුව පමණක් ජලාශයෙන් ජලය ලබාදීම.) |
| 4. | ඇළ වේළි ශුද්ධ කිරීම<br>ප්‍රධාන ඇළ (වාරිමාර්ග දෙපා: මඟින්)<br>බෙදුම් ඇළ (ගොවි සංවිධානය මඟින්)<br>කෙත් ඇළ (ගොවීන් විසින්) | <br>2018/10/20 ට පෙර<br>2018/10/15 ට පෙර<br>2018/10/15ට පෙර |
| 5. | ශුද්ධ නොකරන ලද ඇළවේළි ශුද්ධ කිරීම | 2018/10/20 ට පෙර<br>(ගොවි සංවිධාන අරමුදල් යොදා) |
| 6. | වගා කටයුතු ආරම්භ කිරීම | 2018/10/21සිට -වර්ෂා ජලයෙන් |
| 7. | වගාව පිහිටුවා අවසන් කිරීම | 2018/11/10 ට පෙර |
| 8. | මුර ජලය නිකුත් කිරීම | 2018/11/12 සිට |
| 9. | වගාව සඳහා ජලය නිකුත් කිරීම අවසන් කිරීම | 2019/02/15 |
| 10. | වගා රක්ෂණය අවසන් කළ යුතු දිනය | 2019/02/15ට පෙර |
| 11. | වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය | හානී වී දින14 ක් ඇතුළත |
| 12. | අස්වනු නෙළා අවසන් කළයුතු දිනය | 2019/03/15 ට පෙර |

1994 අංක 13 දරණ (සංශෝධිත) වාරිමාර්ග අඥාපනතේ II වන උප වගන්තිය අනුව ඉදිරි කන්නයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත නීති රීති.

01. කෙත් ඇළ සහ බෙදුම් ඇළ නඩත්තුව සඳහා අක්කරයකට රු.300.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.

02. නියමිත දිනට බෙදුම් ඇළ සහ කෙත් ඇළෙහි තම කොටස නඩත්තු නොකරන ගොවීන්ගෙන් බඹයකට රු.200.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.

03. ගවයන් වගා බිම් වලට අනවසරයෙන් ඇතුළත් කිරීම හා වගා පාලු කිරීමේ දඩය ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ තක්සේරු අනුව.

04. වාරි නිර්මිත වලට හානි කිරීම හා අනවසරයෙන් බට දැමීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තක්සේරු අනුව

ඉහත කන්න රැස්වීමේදී ගන්නා ලද තීන්දු තීරණ ජලාශයේ පවතින ජල තත්වය, හා ප්‍රදේශයේ පවතින කාලගුණික වෙනස්වීම් මත, සංශෝධනය කර ගැනීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා අවශ්‍ය තීන්දු තීරණ ගැනීමේ බලය දිස්ත්‍රික් ලේකම්තුමා විසින් ව්‍යාපාර කමිටුවට පවරන ලදී.

2018/2019 මහ කන්න රැස්වීමේ දී, ගන්නා ලද තීන්දු තීරණ හා නීති රීති සුදුසු බවට වම් ඉවුර ඩී4 තල්වැහැර ගොවිසංවිධානයේ ගරු සභාපති එන්.ඩී ගුණතිලක මහතා විසින් යෝජනා කරන ලද අතර, දකුණු ඉවුර යාය 6 බෙදුම් ඇළ ගොවි සංවිධානයේ ගරු සභාපති එච්.එම් මුදියන්සේ මහතා විසින් එය ස්ථිර කරන ලදී.

13.ගොවි සංවිධානවල ගැටලු හා යෝජනා ඉදිරිපත් කිරීම සහ විසදුම් ලබා දීම.

| ඉදිරි පත් කළ අය | ගැටලු / යෝජනාව | විසදුම/අදහස් දැක්වීම |
|---|---|---|
| වම් ඉවුර ඩී7දාගම ගොවිසංවිධානයේ ගරු භාණ්ඩාගාරික | රක්ෂණ වන්දි මුදල් ජනතාව අතට පත් වීමට කොපමණ කාලයක් ගත වන්නේද යන්න විමසන ලදි. | කෘෂි රක්ෂණ මණ්ඩලය සහකාර අධ්‍යක්ෂ- ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිර්දේශය තහවුරු කල විගස රක්ෂණ වන්දි මුදල් ජනතාව අතට පත් වීමට කටයුතු කරන බව දන්වන ලදි. |
| වම් ඉවුර සිසිල් පොකුණ ගොවිසංවිධානයේ ගරු සභාපති | පැරෂුට්තැටි ඉල්ලුම් කර ඇති නමුදු එය අවශ්‍යතාවට නොලැබීමට හේතු විමසන ලදි. | කෘෂිකර්ම උපදේශක- රඹේ කලාපය - මේ වර්ෂය තුල ඉල්ලුමට සරිලන තැටි නොලැබුන බවද ලැබුන විගස ගොවීන්ට ලබා දීමට කටයුතු කරන බව ද වෙළඳපලෙන් හෝ මිලදී ගෙන වගා කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදි. |

14. දිස්ත්‍රික් ලේකම්තුමාගේ මුලාසන කතාව.

2018/2019 මහ කන්නය සාර්ථක කර ගැනීමට ගොවි මහතුන්ගේ උනන්දුව හා කැපවීමත් නිළධාරීන්ගේ සහයෝගයත් ඒකාබද්ධව හැකියාව පවතින බවත්, ජලාශයේ ජල මට්ටම අනුව වගා තීරණ වෙනසක් කිරීමට සිදුවුවහොත් ඒ සඳහා අවශ්‍ය සංශෝධන සිදු කිරීමේ බලය ව්‍යාපාර කමිටුවට පවරමින් මෙම රැස්වීමට සහභාගී වූ සියළු රාජ්‍ය නිළධාරීන් සහ ගොවි සංවිධාන නිළධාරීන්ට ස්තුති කරමින් 2018/2019 මහ කන්නය සාර්ථක කන්නයක් වේවායි ප්‍රාර්ථනා කරමින් මුලාසන කතාව අවසන්කරන ලදී.

15.ගරු සභාපති-ඒකාබද්ධ ගොවි සංවිධානය- ස්තූති කථාව.

2018/2019 මහ කන්නයේ කන්න රැස්වීමට සහභාගී වූ දිස්ත්‍රික් ලේකම්තුමාට ස්තූතිය පුදකල අතර, පැමිණි සියළුම රාජ්‍ය නිළධාරී මහත්ම මහත්මීන්ට සහ ගොවි සංවිධාන නිලධාරී මහත්ම මහත්මීන්ට ස්තූතිය පුදකරමින් කන්නය සාර්ථක කන්නයක් වේවායි ප්‍රාර්ථනා කරමින් හක්වටුනාඔය ව්‍යාපාරයේ කන්න රැස්වීමේ කටයුතු නිමා කරන ලදී.

..............................................

ගාමිණී ඉලංගරත්න,

දිසාපති/දිස්ත්‍රික් ලේකම්,

කුරුණෑගල.

පිටපත්:-.

01. අධ්‍යක්ෂතුමිය-වාරිමාර්ග කළමනාකරණ අංශය-කොළඹ (කා.දැ.පි)
02.නියෝජ්‍ය ගොවිජනසේවා කොමසාරිස්තුමිය-කුරුණෑගල (කා.දැපි)
03.නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ- කුරුණෑගල (කා.දැපි)
04.කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ- කුරුණෑගල (කා.දැපි)
05.නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්තුමා - කුරුණෑගල (කා.දැපි)
06.ප්‍රාදේශීය ලේකම් -පොල්පිතිගම-(කා.දැපි)
07.සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ-ගල්ගමුව (කා.දැපි)
08.වාරිමාර්ග ඉංජිනේරුතුමා-ඉබ්බාගමුව-(කා.දැපි)
09.ගොවිජනසේවා ප්‍රාදේශීය සංවර්ධන නිළධාරීතුමා -රඹේ (කා.දැපි)
10. සහකාර අධ්‍යක්ෂ-කෘෂි රක්ෂණ මණ්ඩලය -කුරුණෑගල (කා.දැපි)
11. මූලස්ථාන කෘෂිකර්ම උපදේශක- රඹේ (කා.දැපි)
12. කළමනාකරු- (ලංකා බැංකුව,මහජන බැංකුව,ග්‍රාමීය බැංකුව)
13. අදාල වසම්වල කෘ.ප.නි.ස.නිළධාරී මහත්ම මහත්මීන් (කා.දැපි)
14.සියලුම ගොවි සංවිධානවල නිලධාරී මහත්ම මහත්මීන්-හක්වටුනාඔය ව්‍යාපාරය(කා.දැ.පි)